# 6 නෛපාතික කෘදන්ත

**ක්‍රියා මූල :**

කාල, පුරුෂ, වචන ආදිය පදනම් කරගෙන ක්‍රියා මූලවලට ප්‍රත්‍ය ගන්වා විවිධ ස්වරූප බවට පත් කළ හැකි ය. ක්‍රියා පද අතර එසේ වෙනස් කළ නොහැකි ක්‍රියා පද වර්ග කිහිපයක් ඇත. වාක්‍යවල නිපාත ස්වරූපයෙන් යෙදෙන එම ක්‍රියා කෘදන්ත නිපාත හෙවත් නෛපාතික කෘදන්ත යනුවෙන් හැඳින්වේ. පහත දැක්වෙන්නේ ඒවා අතුරින් පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා යන වර්ග දෙක යි.

## 6.1 පූර්ව ක්‍රියාව

සිසුවා මවුපියන් වැඳ නිවසින් පිටව යයි.

මේ වාක්‍යයේ අවසාන ක්‍රියාව "**පිටව යයි**" යන්න යි. එම අවසාන ක්‍රියාවට පෙර සිසුවා විසින් කරන ලද ක්‍රියාවක් මේ වාක්‍යයේ ඇත. ඒ "වැඳ" යන්න යි. ඒ අයුරින් වාක්‍යයක අවසාන ක්‍රියාවට පෙර නිම වූ බව කියවෙන ක්‍රියා "**පූර්ව ක්‍රියා**" නමින් හැඳින්වේ.

පූර්ව ක්‍රියා යෙදී ඇති මේ වැකි දෙස බලන්න.

i) මව කිරි දී දරුවන් පෝෂණය කරයි.
ii) යාචකයා **වාඩි වී** කෑම කයි.
iii) මුවා සිංහයාට **බිය වී නැතිගෙන** දිව්වේ ය.

එක ම වාක්‍යයක පූර්ව ක්‍රියා කිහිපයක් වුව ද යෙදී තිබිය හැකි ය.

උදා :-
i) ළමයා උදෙන් **අවදි වී** දත් **මැද** මුව **සෝද** ආහාර අනුභව කරයි.
ii) රන්කරුවා රන් පිරිසිදු **කර** ආභරණ **සාද** ඔප **දමා** මිලට දෙයි.
iii) දුටුගැමුණු රජු වෙහෙර විහාර **කරවා** වැව් අමුණු **තනවා** දැහැමි ඔවදන් **ලබා** රට පාලනය කළේ ය.

**6.1 ක්‍රියාකාරකම**

i. පහත සඳහන් පද්‍යයේ සහ ගද්‍ය කොටසේ ඇති පූර්ව ක්‍රියා පද තෝරා ලියන්න.

ඔන්න මලේ ඔය නාමල නෙලා     වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා     වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා     වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී     වරෙන්

"අම්මා මැරෙන විට මගේ වයස අවුරුදු හතකට වැඩි නොවී යයි, මගේ තාත්තාත් සමහර විට කුඩම්මාත් කියනු මා අසා තිබේ. අම්මා මැරුණු දවසේ තාත්තාත් නැන්දත්

තවත් නැයනුත් හැඬූ සැටි මට මතක් කළ හැකි ය. එදා මා හැඬුවේ තාත්තාත් අනිත් නැයනුත් හඬන්ට වූ බැවිනි. නැන්දා මා වඩා ගෙන මිදුලට බැස මා පරක්කරන විට ගැහැනුන් කිහිප දෙනෙකු "අනේ, අම්මා නැති දරුවා, යි කියමින් මගේ ඔළුව අත ගා මගේ මුහුණ බලා ගිය සැටි තව ම අමතක නොවී ය.

-මඩොල්දූව -

-මාර්ටින් වික්‍රමසිංහ-

ii. පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය දහයක් නිර්මාණය කරන්න.

පැවරුම

පූර්ව ක්‍රියා පද යෙදුණු පුවත්පත් වැකි එකතු කොට අලවා කුඩා පොතක් සාදන්න.

## 6.2 මිශ්‍ර ක්‍රියාව

මිශ්‍ර ක්‍රියා යනු යම් ක්‍රියාවක යෙදෙන අවස්ථාවේ ම තවත් ක්‍රියාවක නිරත වීම යි. මෙහි දී ක්‍රියා දෙක ම එක විට සිදුවේ.

වීරසිංහ ගුරු මහතා නක්කාවිට ගමේ විසූ ගුණවතෙකි. විශ්‍රාම සුවයෙන් පසු වූ ඒ මහතා දිනපතා ම ගමේ විහාරස්ථානයට පැමිණෙයි. විශේෂයෙන් ඔහු විහාරස්ථානයට පැමිණෙන්නේ දිනපතා විහාරස්ථානයට ගෙනෙන පුවත්පත් බැලීමට ය. විහාරස්ථානයට පැමිණෙන සෑම දිනක ම මුලින් ම ඔහු කරන්නේ විහාරයට ගොස් බුදුන් වැඳ විහාරාධිපති ලොකු හාමුදුරුවන් මුණගැසීම ය. ලොකු හාමුදුරුවන් වැඳ ගමේ රටේ තොටේ විස්තර ටිකක් උන්වහන්සේ සමග කතා කිරීමට වීරසිංහ ගුරු මහතා අමතක කරන්නේ නැත.



ලොකු හාමුදුරුවන්ගෙන් සමුගන්නා වීරසිංහ මහතා ආවාස ගෙයින් පුවත්පත ද රැගෙන ඊළඟට යන්නේ ධර්මශාලාවට ය. ඒ පුවත්පත බැලීමට ය. ඔහු පුවත්පත බලන්නේ සාමාන්‍ය කෙනෙකු පුවත්පතක් බලන ආකාරයට නොවේ. ඔහුගේ විශේෂත්වයක් ඇත. පුවත්පතේ පිටු දිග හැර දෑතට ගන්නා වීරසිංහ ගුරු මහතා ධර්මශාලාවේ ඒ කොනේ සිට මේ කොනටත් මේ කොනේ සිට ඒ කොනටත් ඇවිදිමින් පුවත්පත බැලීම ඒ විශේෂත්වය යි. විටෙක ඔහු පුවත්පතේ සමහර කොටස් හඬනගමින් කියවීම ද සිදු කරයි.

ඉහත ඡේදයේ දක්වුණු විස්තරවලට අනුව වීරසිංහ ගුරුමහතාගේ ප්‍රධාන ක්‍රියාව වන්නේ පුවත්පත බැලීම ය. ඔහු ඒ සමග තවත් ක්‍රියාවක් කරයි. ඒ ඇවිදීම ය. ප්‍රධාන ක්‍රියාව සිදු වන අවස්ථාවේ ම තවත් ක්‍රියා සිදු කරන්නේ නම් එවැනි ක්‍රියා මිශ්‍ර ක්‍රියා ලෙස හැඳින්වේ.

ඒ අනුව ඉහත විස්තරය මිශ්‍ර ක්‍රියාව මතු වන සේ එක වැකියකින් ලිවිය හැකි ය.

**වීරසිංහ ගුරු මහතා ඇවිදිමින් පුවත්පත බලයි.**

මෙහි **බලයි** යනු අවසන් ක්‍රියාව වන අතර **ඇවිදිමින්** යන්න මිශ්‍ර ක්‍රියා පදය යි.

**පහත වාක්‍ය දෙස බලන්න.**

i. ගොවියා දහඩිය **වගුරුවමින්** කුඹුර කොටයි.
ii. නළුවා ගී **ගයමින්** රඟපායි.
iii. තරුණිය **ඉකිබිඳිමින්** වැළපුණා ය.

මිශ්‍ර ක්‍රියා සැකසෙන ඉහත ක්‍රමයට අමතර ව පූර්ව ක්‍රියාව දෙවරක් යොදමින් ද මිශ්‍ර ක්‍රියා පද සාදා ගත හැකි ය.

i. නළුවා **ගයගයා** නටයි.
ii. වාදකයා ගී **කියකියා** වයයි.
iii. ළමයා පොත **බලබලා** විෂය කරුණු හදරයි.

6.2 ක්‍රියාකාරකම

i. පහත පද්‍යවල සඳහන් මිශ්‍ර ක්‍රියා පද තෝරා ලියන්න.

කියමින් ගී රස මියුරු
තබමින් පදතල අනුරූ
බඳිමින් දනමන නුවරු
කෙළමින් යෙති බැඳ බහුරූ

කෙළිමින් තැන තැන ලන්දු
දෙන මෙන් කන අම බින්දු
කියමින් සොඳ ගී සින්දු
ඇසුවන් සිත දුක් සින්දු

ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නො දිටි මොක් පුර

ii. මිශ්‍ර ක්‍රියා පද සහිත වාක්‍ය 10ක් ලියන්න.